.

# වරකවත්තේ වෙද පරපුර

පාරම්පරික වෛද්‍ය සුනීතා නන්දනී වීරතුංග

සියවස් කිහිපයක් පැරණි "වරකවත්තේ වෙද පරපුර" හි ලිඛිත ඉතිහාසය ඇරඹෙන්නේ, ශ්‍රී විජය රාජසිංහ රජතුමා මෙරට රජ කළ සමයේ දී ය. වරකවත්ත වෙද පරපුරේ අතීත වෛද්‍යාචාරීන් තම සුවිශේෂ කුසලතා උපයෝගී කර ගනිමින් කැඩුම් බිඳුම් වෙදකම, ඇස් වෙදකම, සර්ප විෂ වෙදකම, ගෙඩි වණ පිළිකා වෙදකම හා බලි තොවිල්, ශාන්ති කර්ම මගින් සුවහසක් ජනයා සුවපත් කරමින් සුවිසල් සමාජ සේවාවක් ඉටු කර ඇත. ඒ පිළිබඳ පැහැදුනු ශ්‍රී විජය රාජසිංහ රජු පැල්මඩුලු ගම්වරය පැල්මඩුලු වෙහෙරට පුද කළ බව පැල්මඩුලු වෙහෙර පිළිබඳ අටුවා ටීකා වල සඳහන් වේ. වර්තමානයේ දී නව වන වෙද පුරුක ලෙස වරකවත්තේ ප්‍රතිකාර පද්ධතිය ක්‍රියාත්මක වේ.

භග්න රෝග චිකිත්සකයන් වෙත පැමිණෙන සෑම රෝගියකුම ඇට බිඳුණු රෝගීහු නොවෙති. කැඩීම බිඳීමට අමතර ව ඇඹරීම, පැනීම, කෙටීම, ඇදීම සහ තැලීම යන ආබාධ වලට ප්‍රතිකාර කිරීමට ද හන්දි වෙද මහතාට සිදු වේ. ඒ නිසා නිශ්චිත වශයෙන් ම ආබාධය කුමක්දැයි දැන ගැනීමට දර්ශනය, ස්පර්ශය, ප්‍රශ්න කිරීම යන කරුණු තුන ඉවහල් කරගත යුතු ය. ඒ අනුව දර්ශනයෙන් ලේ ගැලීම, ඉදිමීම, හුස්ම ගැනීමේ අපහසුව හා වෙව්ලීම, කම්පනය යනාදී කරුණු අවබෝධ කරගත යුතු ය. ස්පර්ශයෙන් භග්න ස්ථානය ඔබා බැලීම, තට්ටු කර බැලීම කළ යුතු ය. ප්‍රශ්න කිරීමෙන් භග්නය ඇති වූ අන්දම පහරක් වැදී සිදු වූවා නම් එය කුමන දේකින් ද, වැටීමකින් නම් කුමන ආකාරයකට ද, කෙතරම් උසක සිට සිදුවී ද ආදී වශයෙන් ප්‍රශ්න මාර්ගයෙන් දැන ගත යුතු ය. රෝගය නිවැරදි ව හඳුනා ගැනීමෙන් ප්‍රතිකාරයේ පහසුව ද, ඉක්මන් සුවය ද ලබා ගත හැකිය. ප්‍රතිකාරය සඳහා තමන් වෙත පැමිණි රෝගියා මුහුණ පා සිටින්නේ කැඩීමකට ද, ඇඹරීමකට ද, පැලීම්, කෙටීම්, උලුක්කුවීම් හෝ තැලීමකට ද යන වග තෝරා ගැනීමට වෛද්‍යවරයා සමත් විය යුතුය. ඒ සඳහා මුලින් සඳහන් කළ දර්ශන, ස්පර්ශන, ප්‍රශ්න පරීක්ෂා යොදා ගැනේ. කැඩුම් බිඳුම් පිළිබඳ සැලකීමේ දී බිඳුණු ස්ථානයක කැඩුණු ස්ථානයට වඩා කුඩා ඇට කැබලි කිහිපයක් රැඳී තිබීමට ඉඩ කඩ පවතියි.

ශරිරයේ අතක් හෝ පයක් නැමීම සෙලවීම කළ හැක්කේ සන්ධි ස්ථානයකින් පමණි. එහෙත් ඇටයක් කැඩුණු තැන අවට ඉදිමේ. කැඩුණු අවයවයේ විරූපී ස්වභාවයක් දැක්වේ. තම අභිමතය පරිදි එසවීමට එහා මෙහා කිරීමට නොහැකි වේ. ස්පර්ශ කළ විට කර කර ශබ්ද ඇති වේ. සමහරුන්ගේ නාඩි වේගය බලවත් වන අතර සමහරුන්ගේ රුධිර වේගය දුබල වේ. සිරුර සුදුමැලි වීම, අධික පිපාසය හා සිහි මූර්ඡා වීමට ද ඉඩ තිබේ. ශරීරය සීතල වන අතර ඇතමුන්ට වමනය ඇති වේ. මේ ලක්ෂණ අනුව එය කැඩීමක් හෝ බිඳීමක් බව හඳුනාගත උතුය. ඇතැම් විට භග්නය සිදු වූ ස්ථානයේ පිටින් තුවාල නොමැති ව ඇට කැබලි කීපයක් රැඳී සිටිය හැකිය. එවැනි අවස්ථා ස්පර්ශයෙන් තේරුම් ගත යුතු අතර ශල්‍යකර්මයක් මඟින් එම ඇට ඉවත් කළ යුතුය. ශල්‍යකර්ම කළ නොහැකි විට එම ස්ථානයේ තුවාලයක් කර ඇට කැබලි පිටතට ඇදී එන ප්‍රතිකාර කළ යුතුය. සමහර විට ඇට කැබලි රැඳුණු විට එම ස්ථානය ඉදිමී පැසවා තුවාල ඇතිකර ඇට කැබලි පිටතට ඇදී ඒමට උත්සාහ කරන බව දකින්නට ලැබේ. ඇට කැබලි ඇතුලේ තිබියදී කරන ප්‍රතිකාර වලින් පලක් නොවේ. මෙවැනි ප්‍රතිකාර කිරීම් වලදී දියවැඩියා රෝගීන් ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

උළුක්කුව, කෙටීම, ඇමැට්ටිය යන වචන තුනෙන්ම ප්‍රකාශ වන්නේ එකම අදහසකි. යම් සන්ධියක්, කණ්ඩරාවක් හෝ මාංශ පේශියක් හැපීමෙන්, තද වීමෙන්, අක්‍රමවත් ලෙස එබීමෙන් එම සන්ධි ස්ථාන වලට සම්බන්ධ ඇට පීඩනය වීම, උළුක්කුව, ඇමැට්ටිය, කෙටීම, වශයෙන් හඳුන්වනු ලැබේ. සමහරු එය ඇට පැනීමක් වශයෙන් සලකා තදින් ඇදීමකට

යොමුකරන බව පෙනේ. එහෙත් ඇට පැනීමක් නොවන නිසා තදින් ඇදීම නොකළ යුතුය. පැනීම යනු යම්කිසි ඇටයක් සන්ධිස්ථානයෙන් ස්වල්ප වශයෙන් හෝ සම්පූර්ණයෙන් ඉවතට පැනීමයි. විශේෂයෙන් උකුල් ඇට, වැලමිට, හා උරහිස් ඇට මේ අතවරයට ලක්වේ. ඇඹරීම යනු යම්කිසි මාංශ පේශියක්, නහරයක්, කණ්ඩරාවක්, සන්ධියක්, ප්‍රමාණයට වඩා උඩට යටට හෝ හරහට නැමී යාම ඇඹරීමයි.

තැල්ම යනු මාංශ පේශියක්, ශිරාවක්, කණ්ඩරාවක්, හෝ සන්ධිස්ථාන ඝන ද්‍රව්‍යයක ගැටීමෙන් ඇතිවන ආබාධය තැල්මයි. මෙය බාහිර අභ්‍යන්තර වශයෙන් දෙවැදෑරුම් වේ. බාහිර තැලීම් වලදී තැලුණු ස්ථානය නිල්පාට වන අතර මාංශපේශි අක්‍රිය වේ. අභ්‍යන්තර තැලීම යනු කුඩා මොළය, පෙනහැලි, අක්මා යනාදියට සිදුවන තැලීමයි. හිසේ සිදුවන තැලීම් වලදී ඇස් රතුපාට විය හැකි අතර නාසයෙන් හෝ කන් වලින් ලේ ගැලීම සිදු විය හැකිය . බෙල්ලෙන් පහළ අභ්‍යන්තර තැලීම් වලදී මුත්‍රා මාර්ගයෙන් හා ගුද මාර්ගයෙන් රුධිරය වහනය වීමට හැකිය.

දේශීය කැඩුම් බිඳුම් ප්‍රතිකාරය අංග කිහිපයකින් සමන්විතය. අස්ථි කැඩීමකදී හෝ සන්ධි පැනීමකදී ආයුර්වේද මතය අනුව දෝෂ කෝපය බලවත් වේ. උස් ස්ථානයකින් වැටීමක් වුවහොත් වාත ප්‍රකෝපනය ද, පපුව පෙදෙස තැල්මක් නම් ශ්ලේෂ්ම කෝපය ද, ස්නායු තැල්මක් නම් පිත් කෝපය ද හට ගනියි. ඇට භග්න වීමක් හෝ සන්ධි පැනීමක් සිදු වූ විගස එය සකස් කිරීම පහසු ය. කල් ගතවීමෙන් ඉදිමුම, වේදනාව උග්‍රවීම නිසා නිසි අයුරු සකස් කිරීම තරමක් දුෂ්කර වන්නේය.

ප්‍රතිකාර කිරීමේ දී මුල් අවස්ථාවේ මැතිරීම, තෙල් ගැල්වීම, කෙම් ක්‍රම යෙදීම, සන්ධි නියම ආකාරයට සකස් කිරීම, මැල්ලුම් වර්ග බැඳීම, හන්දි වඩින (හන්දි වෙන) බෙහෙත් යෙදීම, අවශ්‍ය ස්ථාන වලට පතුරු තබා බැඳීම සහ පත්තු තැවිලි තෙල් ආදිය යෙදීම කරනු ලැබේ. මේ අතර ඉහත සඳහන් දෝෂ කෝප ඇත්නම් ශමන ඔසු යෙදීම, ශරීර අභ්‍යන්තරයට අවශ්‍ය කෂාය, ගුලි, කැඳ, අරිෂ්ට භාවිත කළ යුතුය. අවසාන වශයෙන් හිරු එළියෙන් රත් කර සැකසූ තෙල්කිර භාවිත කරයි. වෛද්‍යවරයාගේ පළපුරුද්ද අනුව භග්නය සකස් කරන අතර අවශ්‍ය විටෙක නිලයක් අල්ලා වේදනාව සමනය කර අස්ථි භග්න සකස් කළ හැකිය.

වැලමිට සන්ධිය විස්ථාපනය වූ විට ලක්ෂණ හා නිමිති ලෙස වැලමිටේ වේදනාව, ඉදිමීම, යටි බාහුව කෙටි වීම, මෘදු බව, ප්‍රගණ්ඩයේ පහළ අන්තය ඉදිරියෙන් දැනීම, ක්‍රියාකරවීම හා එසවීමට නොහැකි වීම සඳහන් කළ හැක. එහි දී රෝග ලක්ෂණ පරීක්ෂා කර බලා ප්‍රතිකාරය කිරීම පහත පරිදි වරකවත්තතේ වෛද්‍යවරුන් විසින් සිදුකරනු ලැබේ.

1. විස්ථාපනය වූ වැලමිට සන්ධිය සකස් කිරීම - එය මහපටැඟිල්ලෙන් පිරිමැද වෙන් වූ සන්ධියෙහි පාරම්පරික භග්න තෙල් ආලේප කර හැකිලීම , දිගහැරීම ආදී ක්‍රම වලින් නිසි තැනට සන්ධි යොදා පුළුන් භග්න තෙල් වලින් පොඟවා වැලමිටෙන් ඉහළ පතුරක් තබා වෙලුම් පටි යෙදීම - දින 03යි. භග්න තෙල් යෙදීමෙන් පසු රෝගියාගේ වේදනා, කැක්කුම්, තුන්දොස් සමනයට ඖෂධීය ගුලියක් ලබාදීම. දිවුල් මද, කරාබු නැටි, සාදික්කා, වසාවාසි, වියළි ඉඟුරු, සියඹලා ඇට මද, අබ, අසමෝදගම්, කලාඳුරු අල, මදුරුතලා ඇට, හල්දුම්මල, දෙළුම් ලෙල්ල, දුම්මැල්ල, සූදුරු, එනසාල්, නාමල් රේණු, කුරුඳුපොතු, කොත්තමල්ලි, ඉරිවේරිය, ගම්මිරිස්, බෙලි මද, තිප්පිලි යන මේවා වියලා සමව ගෙන මීපැණියෙන් අඹරා දින 03ක් තබා මදටිය ඇටයක පමණ ගුලි දසමුල් තැම්බූ වතුරින් පැය 04ට වරක් බීමට දීම.

2. කොටදිඹුලා, වල්කැප්පෙටියා කොළ, පොතු කහ, ලුණු දමා කොටා මලවා තෙල් ගා බැඳීම - දින 01යි.

3. අට්ටික්කා, කොතල හිඹුටු, පුපුල කොළ පොතු , කහ, ලුණු ලා කොටා මලවා තෙල්ගා බැඳීම දින 01යි.

4. නවහන්දි, හාතාවාරිය, එළබිම්තඹුරු, ඔළිඳ, කොබ්බෑ කොළ සමව ගෙන පොල් බෑයක පොල් , කහ, ලුණු ලා කොටා කබලේ උණු ගන්වා බැඳීම.

5. රැන මැඩියා, ඔළිඳ, හාතාවාරිය, බැලතණ, අමුකහ, දෙමිට බැගින් ගෙන කොටා මිරිකාගත් යුෂ පත දෙකකට දිය නුමුසු තැඹිලි පොල්කිරි දෙපතක් දම අවුවේ සිඳුවගෙන ආලේප කිරීම.- දින 03යි. සන්ධි බැඳීමෙන් පසු නහර ප්‍රාණවත් වීමට ඉහත ප්‍රතිකාරය යොදා ගැනේ.

6. බැලතණ, මස්බැද්ද, වෙල්ලන්ගිරිය, ඇහැලපොතු, ඇට්ටමුරා පොතු සම ව ගෙන කොටා මිරිකා එම ඉස්මට හීනටි හාල්, උළුහාල් අඹරා දමා පත්තුව පදමට කකාරා, කිතුල් පැණි පොල් පැණි දමා ආලේප කිරීම - දින 02යි

7. නා පොතු, මිල්ල පොතු, කිරිඳි වැලේ පොතු, රදලිය පොතු, ඇල්බැද්ද පොතු, වෙනිවැල් ගැට, එක පමණට ගෙන කොටා මිරිකා පොල් හකුරු බෑයක් දමා පැණි පදමට සිඳ ආලේප කිරීම

ප්‍රතිකාර කිරීමේදී සැලකිලිමත් විය යුතු විශේෂ කරුණු ලෙස රෝගියාගේ ඉක්මන් සුවය සඳහා ප්‍රතිකාර කරන විට පිළිපැදිය යුතු කරුණු පිළිබඳ ව රෝගියාට වටහා දීම සිදුකළ යුතුය. භග්න රෝගීන්ට පත්‍ය අපත්‍ය සඳහන් කිරීම චිකිත්සාව සිදුකරන වෛද්‍යවරයාගේ යුතුකමයි. එය පහත ලෙස දැක්විය හැක.

- මද විසින් ආහාර වලඳන්නා වූ, අනාත්මවත් (නොදිනූ ඉඳුරන් ඇත්තා වූ, අපත්‍ය දේ සේවනය කරන්නා වූ ) ජ්වර, ආධ්මාන ආදී උවදුරු වලින් පෙළෙන්නාවූද රෝගියාගේ භග්නය දුක සේ සුව වෙයි.
- ලුණු, කුළු, ක්ෂාර, ඇඹුල් යන මේවා ද , මෛථුනය, අව්ව, රළු ආහාර වර්ග යන මේවා ද, භග්න රෝගියා විසින් සේවනය නොකළයුතුය.
- ඇල්හාලේ බත්, මස් රස, එළකිරි, ගිතෙල්, බෝල කඩල යොදා පිළියෙල කළ යූෂ (සුප්), පුෂ්ටිකර ආහාර වර්ග යන මේවා භග්න රෝගියාට සේවනය උදෙසා දෙන්නේය.

භග්න බන්ධන - ලේපන ද්‍රව්‍ය ලෙස වැල්මී, අත්තික්කා, බෝ, කැල, කුඹුක්, උණ, හළු, නුග යන මේවායේ පොතු, උණ, ලී පතුරු ආදිය වණ බැඳීම සඳහා සංග්‍රහ කොට ගන්නේය.

ඍතු භේද අනුව බන්ධන විධි ලෙස සෞම්‍ය (ශීත) ඍතු වලදී සතියෙන් සතිය (පළමුව කළ බැඳුම සතියක් ගිය විට ලිහා දමා අලුතින් යළිත්) භග්නය බඳින්නේය. සාධාරණ (ඉතා ශීතල හෝ උෂ්ණ නොවන ) ඍතුවල දී දින පහෙන් පහට ද, උෂ්ණ කාලයේ දී දින තුනකට වරක් ද වණය බඳින්නේය. බිඳී ගිය තැන යෙදූ බැඳුම ඉතා බුරුල් වුවහොත් සන්ධියේ ස්ථිරත්වය ඇති නොවේ. දැඩි සේ බැඳීම හේතුවෙන් සිව් ආදියේ ඉදිමුම, වේදනාව, පැසවීම ආදිය උපදනේය. භග්න ස්ථානය එම නිසා සම භාවයෙන් බැඳීම ප්‍රශස්තය.